ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා තරුණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය

# රැකියා පුරප්පාඩු

ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා තරුණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, දැනට අග්‍රහාර වෛද්‍ය රක්ෂණ හා වගා රක්ෂණ වැනි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් 2008 වර්ෂයේ සිට කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. 2006 වර්ෂයේදී පිහිටුවන ලද මෙම අරමුදල් මණ්ඩලය කෙටි කාලයක් තුළදී නවීකරණය, වර්ධනය හා ලාභදායීත්වය සැලකීමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සහකාර සාමාන්‍යාධිකාරී (රක්ෂණ)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සහ

වරලත් රක්ෂණ ආයතනයේ සාමාජිකත්වය (ACII) ලබා තිබීම.

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක සේවා පළපුරුද්ද

**වැටුප් පරිමාණය** : රු. 41,745 - 15 x 1,100 - 58,245

**වයස** : අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම** : මෙම පත්වීම ස්ථිර පත්වීමක් වේ. සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**වෙනත් ප්‍රතිලාභ :**

- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ඉන්ධන දීමනාවක් සහිතව වාහනයක් අනුයුක්ත කරනු ලැබේ.
- පූර්ණ වෛද්‍ය රක්ෂණාවරණයක් සඳහා හිමිකම් ඇත.
- වෘත්තීය සාමාජිකත්වය අලුත් කිරීම සඳහා අවශ්‍ය වාර්ෂික දායක මුදල් සඳහා අනුග්‍රාහකත්වය දක්වනු ලැබේ.

## 02. සහකාර සාමාන්‍යාධිකාරී (මුදල් හා සංස්ථාපිත සේවා)

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියක් හා කළමනාකරණය හෝ ගිණුම්කරණය ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ICASL) හෝ වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ACCA) හෝ වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය (එක්සත් රාජධානිය) (CIMA) වැනි පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සුදුසුකම් හෝ

අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ I ශ්‍රේණියේ සේවා පළපුරුද්ද සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ICASL) හෝ වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ACCA) හෝ වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය (එක්සත් රාජධානිය) (CIMA) වැනි පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : රු. 41,745 - 15 x 1,100 - 58,245

**වයස** : අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම** : මෙම පත්වීම ස්ථිර පත්වීමක් වේ. සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**වෙනත් ප්‍රතිලාභ :**

- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ඉන්ධන දීමනාවක් සහිතව වාහනයක් අනුයුක්ත කරනු ලැබේ.
- පූර්ණ වෛද්‍ය රක්ෂණාවරණයක් සඳහා හිමිකම් ඇත.
- වෘත්තීය සාමාජිකත්වය අලුත් කිරීම සඳහා අවශ්‍ය වාර්ෂික දායක මුදල් සඳහා අනුග්‍රාහකත්වය දක්වනු ලැබේ.

## 03. සහකාර කළමනාකරු (නීති)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් නීති උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු නීති ක්ෂේත්‍රයට අදාළව වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය** : රු. 25,640 - 3 x 665 + 7 x 735 + 15 x 925 - 46,655

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම** : මෙම පත්වීම ස්ථිර පත්වීමක් වේ. සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**වෙනත් ප්‍රතිලාභ :**

- පූර්ණ වෛද්‍ය රක්ෂණාවරණයක් සඳහා හිමිකම් ඇත.
- වෘත්තීය සාමාජිකත්වය අලුත් කිරීම සඳහා අවශ්‍ය වාර්ෂික දායක මුදල් සඳහා අනුග්‍රාහකත්වය දක්වනු ලැබේ.

## 04. කළමනාකරණ සහකාර

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී,

1. සිංහල / දෙමළ
2. ගණිතය

ඇතුළු විෂයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් 06 කින් සමත් වීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය විෂයන් 03 කින් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

සහ

රක්ෂණය හෝ ගිණුම්කරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් තිබීම.

**වැටුප් පරිමාණය** : රු. 13,450 - 10 x 145 +7 x 170 + 4 x 240 + 20 x 320 - 23,450

**වයස** : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම** : මෙම පත්වීම ස්ථිර පත්වීමක් වේ. සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**වෙනත් ප්‍රතිලාභ :**

- පූර්ණ වෛද්‍ය රක්ෂණාවරණයක් සඳහා හිමිකම් ඇත.

**කොන්දේසි :**

**සියලුම අයදුම්කරුවන්,**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
- යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

**අයදුම්කරුවන්,**

නිර්දේශකයන් දෙදෙනෙකු නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පත්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමඟ එවිය යුතු වේ.

දැනටමත් රාජ්‍ය / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු නිලධාරීන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා අයදුම්පත එවිය යුතු වේ.

අයදුම්කරුවන් ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කර ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, නො. 97, මරදාන පාර, කොළඹ 10 යන ලිපිනයට 2015.06.01 දිනට පෙර එවිය යුතු වේ.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන විධායක නිලධාරී**
**ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය**
**නො. 97, මරදාන පාර,**
**කොළඹ 10.**